# සෙංකෝලය

නැගෙනහිර පළාත් සභාවේ පුවත් සංග්‍රහය

පළමු කලාපය | පළමු කාර්තුව - 2012 | වෙළුම - 08

## ගරු ප්‍රධාන අමාත්‍යතුමා අයවැය වාර්තාව ඉදිරිපත් කරයි

නැගෙනහිර දෙවන පළාත් සභාවේ පළමු අයවැය වාර්තාව පළාත් ප්‍රධාන අමාත්‍ය නජිබ් ඒ. මජිද් මැතිතුමා විසින් 2012 දෙසැම්බර් 11 දින නැගෙනහිර පළාත් සභාවට ඉදිරිපත් කරන ලදි.



මේ සඳහා වූ සැසිය පෙරවරු 10.30ට ගරු සභා නායක ඩබ්.පී.එම්. ආරියවති ගලප්පත්ති මැතිණියගේ ප්‍රධානත්වයෙන් ඇරඹිණි.

සංවර්ධනයේ ප්‍රතිඵල සියළු ජාතීන් අතර සමානව බෙදී යන අයුරින් පළාත තුළ ප්‍රාදේශිය වර්ධනයේ උස් මිටිකම් ඉවත් කිරිම හා සමාන ප්‍රාදේශිය සංවර්ධන ක්‍රියාදාමයන් මෙම අයවැය කතාවේදි යෝජනා කරන අතර හඳුනාගත් පසුගාමි ප්‍රදේශවලට වැඩි අවධානයක් යොමුකර අඩු ආදායම් ලාභි දුප්පත් ජනයාගේ හැකියාව හා ප්‍රාදේශිය භෞතික සම්පත් උපයෝගි කර ගනිමින් නිෂ්පාදනය වැඩි කිරිම මගින් රැකියා අවස්ථා ඇති කර ජනතාවගේ ජිවන මට්ටම දියුණු කිරිම මාගේ ප්‍රධාන උපාය වනු ඇති බව ගරු ප්‍රධාන අමාත්‍යතුමා තම අයවැය කතාවේදි ප්‍රකාශ කරන ලදි.

(ඉතිරිය 3 පිටුව)

## නැගෙනහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා 15 වන ආණ්ඩුකාරවර සමුළුවට

15වන ආණුකාරවර සමුළුව මෙවර උතුරු පළාත් ආණ්ඩුකාරවර ජී.ඒ. චන්ද්‍රසිරි මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් යාපනය නගරයේදි පැවැත්විණි. නොවැම්බර් මස 14 සිට 16වන දින දක්වා පැවැත් වූ මෙම සමුළුවේදි නැගෙනහිර පළාත් ගරු ආණ්ඩුකාර මොහාන් විජේවික්‍රම මැතිතුමාද සහභාගි විය. මෙවර පැවැත් වූ සමුළුව සිංහල හා දෙමළ පාරම්පරික ක්‍රම මත පවත්වන ලදි. රටේ විවිධ ප්‍රදේශ වලින් පැමිණ සහභාගි වූ නැටුම් හා රංගන ශිල්පින්ගේ සංස්කෘතික කලාංග වේදිකාගත කෙරිණි.



උතුරු පළාත් ආණ්ඩුකාරතුමන් විසින් සිය පිළිගැනිමේ කථාවේදි උතුරු පළාත් සභාවේ රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන සමාජ හා ආර්ථික සංවර්ධන ක්‍රියාදාමයන් පිළිබදව අනෙකුත් ආණ්ඩුකාරවරුන් දැනුවත් කරන ලදි.

## මඩකලපුව ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශනය (BITE)

මඩකලපුව ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශනය නැගෙනහිර පළාත් ගරු ප්‍රධාන අමාත්‍ය නජිබ් අබ්දුල් මජිඩ් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් නිල වශයෙන් විවෘත කෙරිණි. මෙම ප්‍රදර්ශනය ඔක්තෝබර් මස 12 වන



දින සිට 14 වන දින දක්වා මඩකලපුව ශිවානන්දා විද්‍යාලයීය ක්‍රිඩාංගනයේදි පැවැත් විණි.

මෙම ප්‍රදර්ශනයේ සමාරම්භක උත්සවය සඳහා නැගෙනහිර පළාත් හිටපු ප්‍රධාන අමාත්‍ය හා ජනාධිපති උපදේශක සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් මහතා හා මඩකලපුව දිස්ත්‍රික් ලේකම් පී.එස්.එම්. චාල්ස් මහත්මිය ඇතුළු ආරාධිතයන් රැසක් සහභාගි වූහ.

කර්මාන්ත හා වෙළඳ අමාත්‍යාංශය, දේශිය රැකියා අවස්ථා සංවර්ධන අධිකාරිය (NEDA) යන ආයතන වල සහයෝගය මත මඩකලපුව දිස්ත්‍රික් වෙළඳ කර්මාන්ත හා කෘෂි සංගමයේ මෙහෙයවිම යටතේ මෙම ප්‍රදර්ශණය පැවැත්විණි.

මෙවැනිම වූ විශාල ප්‍රදර්ශනයක් 2011 වසරේදිද මඩකලපුවේදි පැවැත් වූ බව මෙහිදි සඳහන් කළ යුතුය.

# ජාත්‍යන්තර වැඩිහිටි දිනය සැමරේ

මේ වසරේ ජාත්‍යන්තර වැඩිහිටි දින සැමරුම් උත්සවය නැගෙනහිර පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂක එන්.මනිවන්නන් මහතාගේ ප්‍රධානත්වයෙන් සම්මන්තුරේ අබ්දුල් මජීඩ් නගර ශාලාවේදී පසුගිය 2012.10.30 දින පැවැත් විණි.

මෙම අවස්ථාවට නැගෙනහිර පළාත් ගරු සෞඛ්‍ය අමාත්‍ය එම්.අයි.එම්. මන්සූර් මැතිතුමා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගී වූ අතර සෞඛ්‍ය අමාත්‍යංශ ලේකම් එස්.අමලනාදන් මහතාද ආරාධනා ලැබ සිටියේය.

## පළාත් පාලන ආයතන ප්‍රධානීන්ට එක් දින වැඩමුළුවක්

නැගෙනහිර පළාත් පාලන ආයතන ප්‍රධානීන් සඳහා එක් දින වැඩමුළුවක් පසුගිය 2012.11.22 දින නැගෙනහිර පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් යූ.එල්.ඒ. අසීස් මහතාගේ ප්‍රධානත්වයෙන් ගිරිතලේදී පැවැත් විණි.

අවබෝධතාවය හා කැපවීම මත ජනතාවට සේවය කිරීම සඳහා අවශ්‍ය සන්නිවේදනකරුවන් අතර වූ සම්බන්ධතාවය පුළුල් කරන්නේ කෙසේද යන්න මෙහි තේමාව විය. මෙය පුරනැගුම වැඩසටහන් කළමනාකරණ අංශයේ තොරතුරු අධ්‍යාපන හා සන්නිවේදන අංශය මගින් අනුග්‍රහය දක්වන ලදි.

මෙම අවස්ථාවට පළාත් සැළසුම් අධ්‍යක්‍ෂක හා පළාත් පාලන කොමසාරිස් වන එම්. උදය කුමාර් මහතා ඇතුළු සැළසුම් කළමනාකරණ අංශයේ ජ්‍යේෂ්ඨ නිලධාරීහු ද සහභාගී වූහ.

## කතෘගෙන්.......

නැගෙනහිර දෙවන පළාත් සභාව ඇරඹීමෙන් පසුව එළිදක්වන පළමු සංකෝලය මෙය වේ.

පළාතේ දෙවන පරිපාලන කාලය යනු පසුගිය කාලයෙන් ලබා ගත් අත්දැකීම් හා සංවර්ධනයේ දියුණුව නිරන්තරයෙන් ඉදිරියටත් රඳවා ගනිමින් උද්වේගවත්ව දිරිගන්වා ඇත.

විශේෂයෙන් නැගෙනහිර පළාතේ දිස්ත්‍රික්ක තුනම සමාන්තරව සංවර්ධනය විය යුතු බැවින් තම සංවර්ධන ඉලක්ක, සැලසුම් සකස් කරමින් පවතින බව හුවා දැක්විය යුතුය. මේ සම්බන්ධයෙන් නැගෙනහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා ගරු ප්‍රධාන අමාත්‍යතුමා ගරු ඇමතිවරු ආදි සියළු දෙනා දැඩි උනන්දුවකින් ව්‍යාපෘති සකසා ඒවා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය උපදෙස් හා මගපෙන්වීම සිදු කරමින් සිටියි.

මේ මගින් පසුගිය වකවානුවේදී ලබා ගන්නා ලද ප්‍රතිඵල වලට වඩා සියළු ක්ෂේත්‍රයන්ගේ විශාල දායකත්වයක් ජාතික මට්ටමින් ලබාදිය හැකිබව මාගේ විශ්වාසයයි.



ප්‍රාදේශිය මට්ටමින් තෝරාගනු ලැබූ ශ්‍රේෂ්ඨ වැඩිහිටියන්ට සම්මාන ප්‍රධානය කිරීම මෙහිදී පැවැත්වුණු විශේෂිත සිද්ධියකි. එසේම වැඩිහිටි නිවාස හා වැඩිහිටි සමිති අතර පැවැත් වූ තරග වලින් ජයගත් වැඩිහිටියන්ට ත්‍යාග ප්‍රධානෝත්සවයක්ද පැවැත් විණි.

## ඒකාබද්ධ වර්ෂාවසාන ක්‍රියාත්මක කිරීමේ සැලසුම් 2013

කෙටි කාලීන ආයතන ප්‍රතිපල සටහනට අනුකූලව පළාත් සභා සැසියේදී ගන්නා ලද තිරණයට අනුව පළාත් මට්ටමින් සිදු කරන සියළු වැඩ සටහන් ව්‍යාපෘති ඇතුළත් කර සකස් කරන ලද ඒකාබද්ධ වර්ෂාවසාන ක්‍රියාත්මක කිරීමේ සැළසුම ගුණාත්මකව හා ප්‍රමාණාත්මකව දියුණු කිරීම සඳහා අවශ්‍ය කටයුතු නියෝජ්‍ය ප්‍රධාන ලේකම් - ක්‍රමසම්පාදන කාර්යාලය මගින් සිදු කරමින් පවති.

2013 වසර සඳහා ඒකාබද්ධ වසර අවසාන ක්‍රියාත්මක කිරීමේ සැලසුම ආයතන ප්‍රතිඵල සටහනට අනුව හඳුනා ගන්නා ලද අරමුණු හා ඉලක්ක කරා ගමන් කිරීම අරමුණු කොට ගෙන සකස් කරමින් පවති.

මෙහි ප්‍රතිඵලයක් ලෙස පළාත් මූල්‍ය ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කළ හා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති නැවතත් වෙනත් මූල්‍ය ප්‍රතිපාදන මගින් ක්‍රියාත්මක කිරීමේ අවස්ථාවන් නැති කිරීමට පළාතේ සියළු ව්‍යාපෘති වල තොරතුරු රැස් කිරීමටත් එහි ප්‍රගතිය අධීක්‍ෂණය කිරීමටත් හැකි වී තිබේ.

මෙම ක්‍රියාව මූල්‍ය සේවා කොමිෂන් සභාවෙන් ලබා දෙන ලද උපමාන පාදක ප්‍රධාන රුපියල් මිලියන 217 මුදල හා පළාත් කාර්ය නිශ්චිත ප්‍රධාන යටතේ රුපියල් මිලියන 1000 හා විශේෂ පළාත් ග්‍රාමීය මාර්ග සංවර්ධන හා ග්‍රාමීය ජල සම්පාදන ව්‍යාපෘතිය ආදිය සඳහා රුපියල් මිලියන 3915 ක මුදලක් වෙන් කර ඇත. අනෙකුත් සියළු මූල්‍ය සම්පාදන තුළින් නෙල්සිප් වැනි වූ විශේෂ උප ව්‍යාපෘති ඇතුළත් බව වසර අවසාන හා ඒකාබද්ධ ක්‍රියාත්මක සැළසුම සකස් කළ බව කිව යුතුය.


ප්‍රකාශන කමිටුව

| | |
|---|---|
| අනුශාසක | D.M.S.අභය ගුණවර්ධන<br>ප්‍රධාන ලේකම් |
| ප්‍රධාන කතෘ | U.L.A.අසීස්<br>ලේකම් |
| උපදේශක කමිටුව | K.කරුණාකරන්<br>ලේකම් |
| | M.C.M.ෂෙරීෆ්<br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් |
| | D.W.U.වැළිකල<br>අධ්‍යක්‍ෂක |
| | V.මහේන්ද්‍රරාජා<br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් |

## නැගෙනහිර පළාත් ප්‍රධාන අමාත්‍යතුමා බ්‍රිතාන්‍ය තානාපතිතුමා හමුවේ.

නැගෙනහිර පළාත් ගරු ප්‍රධාන අමාත්‍ය නජිබ් ඒ මජිද් මැතිතුමා හා ලංකාවේ බ්‍රිතාන්‍ය උප තානාපති රොබිබුලොකින් මැතිතුමා අතර හමුව පසුගිය 2012 නොවැම්බර් 19වන දින ත්‍රිකුණාමලය ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දි පැවැත්විණි. මෙහි දි පළාතේ සංවර්ධන කාර්යයන් හා පළාත් සභාවේ පරිපාලන ක්‍රියාවලිය පිළිබඳ සාකච්ඡා කෙරිණි. මේ සඳහා ප්‍රධාන අමාත්‍ය ලේකම් යූ.එල්.ඒ. අසීස් මහතා ද සහභාගී විය. එසේම



නැගෙනහිර පළාත් සභාවේ විපක්ෂ නායක එස්. තන්ඩායුදපානි මහතා ද බ්‍රිතාන්‍ය තානාපතිතුමා පෞද්ගලිකව හමු වී සාකච්ඡා කරන ලදි.

## වාලච්චේන මූලික රෝහලට ශල්‍ය වෛද්‍ය සංකීර්ණයක්

වාලච්චේන මූලික රෝහලේ ගොඩනගන ලද නව ශල්‍ය වෛද්‍ය ගොඩනැගිලි සංකීර්ණය නැගෙනහිර පළාත් ගරු සෞඛ්‍ය අමාත්‍ය එම්.අයි.එම්. මන්සූර් මැතිතුමා විසින් විවෘත කරනු ලැබිණි. මෙම උත්සව අවස්ථාව සඳහා නැගෙනහිර පළාත් ගරු කෘෂිකර්ම අමාත්‍ය හාෆිස් නසීර් අහමඩ් මැතිතුමා ජර්මන් රතුකුරුස සංවිධානයේ ලංකා නියෝජිත ඩිම් බ්‍රේ ලංකා රතුකුරුස සංවිධානයේ සභාපති ජගත් අබේසිංහ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෛද්‍ය එම්. දේවරාජන් ඇතුළු සෞඛ්‍ය ක්ෂේත්‍රයේ නිලධාරීහු රැසක් සහභාගී වූහ. මෙම ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා යුරෝපා සංගමය, ජර්මානු රතුකුරුස



සංවිධානය හා ලංකා රතුකුරුස සංගමය විසින් මුදල් ප්‍රතිපාදන ලබා දී ඇති බව සඳහන් කළ යුතුය.

## දේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුවේ සේවය වැඩිදියුණු කිරීම සඳහා ක්‍රියා මාර්ග ගැනේ.

නැගෙනහිර පළාත තුළ දේශීය වෛද්‍ය සේවා දියුණු කිරීමේ අරමුණින් අම්පාර දිස්ත්‍රික්කයේ දෙහිඅත්ත කණ්ඩිය ප්‍රදේශයේ රුපියල් මිලියන 4.4ක මුදල් ප්‍රතිපාදනයෙන් ඉදිකරන ලද ආයුර්වේද රෝහල පසුගියදා ජනතා අයිතියට පත් කරන ලදි.

එසේම අම්පාර සෞඛ්‍ය වෛද්‍ය අධිකාරී කාර්යාලයේදී දෙදින ඇකියු පංචර් කඳවුරක් පසුගිය ඔක්තෝබර් 23 හා 24 දිනවලදී පවත්වන ලදි. මෙහිදී රෝගීන් 1750කට ආසන්න පිරිසක් ප්‍රතිකාර ලබා ගත් බව විශේෂයෙන් සඳහන් කළ යුතුය.

මෙම අවස්ථාවන් සඳහා නැගෙනහිර පළාත් ගරු සෞඛ්‍ය අමාත්‍ය එම්.අයි.එම්.මන්සූර් මැතිතුමා හා පළාත් සභාවේ ගරු උප සභාපති එම්.එල්.සුබෛර් මැතිතුමාද ආරාධිතයන් ලෙස සහභාගී වූහ.

## ගරු ප්‍රධාන අමාත්‍යතුමා 2013 අයවැය වාර්තාව ඉදිරිපත් කරයි.....

ඉදිරිපත් කරන ලද අයවැය වාර්තාව පරිදි 2013 වසර සඳහා මූල්‍ය කොමිෂම විසින් නැගෙනහිර පළාත් සභාවට පුනරාවර්තන වියදම් සඳහා රුපියල් මිලියන 14206ක්ද, ප්‍රාග්ධන වියදම් සඳහා රුපියල් මිලියන 1217ද, විදේශ හා දේශීය ආධාර සමග විශේෂ ව්‍යාපෘති සඳහා රුපියල් මිලියන 3915ක්ද වෙන් කරන ලදි.

මේතුළ පුනරාවර්තන වියදම් සඳහා මධ්‍යම ආණ්ඩුව නැගෙනහිර පළාත සඳහා වෙන් කළ මුදලින් රුපියල් මිලියන 11635ද, රාජ්‍ය ආදයම් ඉතුරුම් ලෙස මධ්‍යම ආණ්ඩුවෙන් රුපියල් මිලියන 1900ක්ද, පළාත් සභා ඉතුරුම් තුළින් රුපියල් මිලියන 671 පමණ ලැබේ යැයි බලාපොරොත්තු වනු ලබයි. මෙසේ එකතුව රුපියල් මිලියන 14206ක් පළාත් සභාවේ පුනරාවර්තන වියදම් සඳහා මිලග වසරේදී භාවිතා කරනු ලබයි. මෙයින් 79%ක මූල්‍ය ප්‍රතිශතයක් පළාත් රාජ්‍ය සේවා සැපයීම සඳහාද 6%ක් රාජ්‍ය සේවා දේපළ නඩත්තුව සඳහා ද වෙන්කර ඇත.

සම්පූර්ණ ප්‍රාග්ධන වියදම් තුළ රුපියල් මිලියන 204ක් නිෂ්පාදන ක්ෂේත්‍රයේ සංවර්ධන සඳහා ද, රුපියල් මිලියන 1217ක් සමාජ යටිතල පහසුකම් හා සේවා සංවර්ධනය සඳහාද, රුපියල් මිලියන 3371ක් ආර්ථික යටිතල පහසුකම් සංවර්ධනය සඳහාද වෙන් කර ඇත.

තවද ප්‍රාදේශීය සංවර්ධනය සමබර කිරීමේ අරමුණින් රුපියල් මිලියන 123ක් මේ වසර සඳහා වෙන්කර ඇත. මෙයට අමතරව ගරු පළාත් සභා මන්ත්‍රීවරුන් විසින් යෝජනා කරන ලද සංවර්ධන ක්‍රියාවලි සඳහා ක්‍රියාත්මක කිරීමට රුපියල් මිලියන 74ක්ද පළාත් ආයතන වල සංවර්ධනය හා සේවා සැපයීම දියුණු කිරීම සඳහා රුපියල් මිලියන 143ක්ද වෙන්කර ඇත.

අයවැය වාර්තාව සඳහා සභාවේ අනුමැතිය ලබනු වස් ඡන්දයක් පවත්වන ලද අතර, පක්ෂව ඡන්ද 20ද විපක්ෂව ඡන්ද 15ක් ද ලබා දී තිබිණි. වැඩි ඡන්ද 5කින් අයවැය වාර්තාව සභා සම්මත විය. මෙසේ අමාත්‍යංශ 5 සඳහාම අදාළ අමාත්‍යවරු විසින් අයවැය වාර්තා ඉදිරිපත් කරනු ලැබ ඊට ඡන්ද පවත්වා සභා සම්මත කළ බව සඳහන් කළ යුතුය.

# නැගෙනහිර පළාතේ රාජ්‍ය සේවයට සංවර්ධන නිලධාරීහු 384 ක් පත්වෙති.

නැගෙනහිර පළාත් සභාවට අයත් රාජ්‍ය ආයතනවල සේවය සඳහා අලුතින් බඳවා ගන්නා ලද සංවර්ධන නිලධාරීන් සඳහා පත්වීම් ලිපි



ප්‍රධානෝත්සවය 2012.12.24 දින ත්‍රිකුණාමලය විවේකානන්ද විද්‍යාලයේදි උත්සවාකාරයෙන් පැවැත්විණි. මෙම අවස්ථාවට නැගෙනහිර පළාත් ගරු ආණ්ඩුකාරවර මොහාන් විජේවික්‍රම මහතා ප්‍රධාන ආරාධිතයා වශයෙන් සහභාගි විය. එසේම නැගෙනහිර පළාත් ගරු ප්‍රධාන අමාත්‍ය නජිබ් මජීද් මැතිතුමා හා නැගෙනහිර පළාත් ගරු සෞඛ්‍ය අමාත්‍ය එම්.අයි.එම්. මන්සූර් මැතිතුමාද, නැගෙනහිර පළාත් ප්‍රධාන ලේකම් ඩී.එම්.එස්. අබයගුණවර්ධන මහතාද ඇතුළු අමාත්‍යාංශ ලේකම්වරු හා දෙපාර්තමේන්තු ප්‍රධානිහු රැසක් මෙම අවස්ථාවට සහභාගි වූහ.

අනෙකුත් පළාත් හා සසඳන කල්හි නැගෙනහිර පළාතට බොහෝ සංවර්ධන නිලධාරීහු පත්වී ඇති බවත් මහජනතාවගේ බදු මුදලින් වැටුප් ලබන රාජ්‍ය සේවකයින් වන සියළුදෙනා වගකීමෙන් හා ධනාත්මක චින්තනයකින් කිසිදු වංචාවකින් තොරව මහජනතාවට සිය සේවය සැපයිය යුතු බවත් මෙතුළින් මව්බිම ආසියාවේ අශ්චර්ය බවට පහසුවෙන් පත්කළ හැකි බවත් සිය කතාවේදි ගරු ආණ්ඩුකාරතුමන් පවසන ලදි.

# ඊ-දිරිය තොරතුරු සන්නිවේදන හා තාක්ෂණ මධ්‍යස්ථානය විවෘත කෙරේ.

ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන නියෝජිතායතනයේ ඊ-දිරිය ව්‍යාපෘතිය යටතේ කළමණාකරණ සංවර්ධන පුහුණු දෙපාර්තමේන්තුවේ පිහිටුවා ඇති තොරතුරු සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන ගරු අමාත්‍ය රංජිත් සියඹලාපිටිය මැතිතුමා විසින් උත්සවාකාරයෙන් විවෘත කරන ලදි. මෙම උත්සව අවස්ථාව සඳහා නැගෙනහිර පළාත් ගරු ආණ්ඩුකාරවර මොහාන් විජේවික්‍රම



මැතිතුමා නැගෙනහිර පළාත් ගරු ප්‍රධාන අමාත්‍ය නජිබ් ඒ මජීඩ් මැතිතුමා හා නැගෙනහිර පළාත් සභා ගරු සභාපතිනිය වන ආරියවති ගලප්පත්ති මැතිණිය නැගෙනහිර පළාත් ප්‍රධාන ලේකම් අබේගුණවර්ධන යන මහත්ම මහත්මීහු සහභාගි වූහ. මෙම අවස්ථාවට ත්‍රිකුණාමල නගරයේ පාසල් 25ක සිසු සිසුවියන් හට ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ICT ත්‍යාග පිරිනැමිණි.

# නැගෙනහිර පළාත් සභා මන්ත්‍රීවරුන්ට දින දෙකක වැඩමුළුවක්

නැගෙනහිර පළාත් ප්‍රධාන ලේකම්තුමාගේ මග පෙන්වීම යටතේ කළමණාකරණ සංවර්ධන පුහුණු දෙපාර්තමේන්තුවේ මෙහෙයවීම යටතේ පළාත් සභා මන්ත්‍රීවරුන් සඳහා දින දෙකක වැඩමුළුවක් පසුගිය නොවැම්බර් 07 සහ 08 යන




දිනයන් හි ත්‍රිකුණාමලයේදි පැවැත්විණි. මෙම අවස්ථාව සඳහා නැගෙනහිර පළාත් ගරු ආණ්ඩුකාරවර මොහාන් විජේවික්‍රම මැතිතුමා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගි වී උත්සවාකාරයෙන් ආරම්භ කරන ලදි.

වැඩමුළුවට සහභාගි වුවන් අතර ගරු ප්‍රධාන අමාත්‍යතුමා ගරු පළාත් සභා සභාපතිනිය ගරු ඇමතිවරු ද ඇතුලත් වූහ. මෙම වැඩමුළුවේ ප්‍රධාන අරමුණ වූයේ මන්ත්‍රී ධුරයේ වගකීම් හා ජනතාවට සේවා සැපයීම කෙරෙහි ඇති වගවීම පිළිබඳව මන්ත්‍රීවරුන්ට පැහැදිලිකර දීමත් නීත්‍යානුකූලව පළාත් සභා පරිපාලන ව්‍යුහය පිළිබඳව පැහැදිලි කිරීමත්ය.

# අමෙරිකානු නියෝජිත පිරිසක් නැගෙනහිර පළාතේ සංචාරයක.

ව්‍යවස්ථාදායකය හා යහපාලනය දිරිගැන්වීමේ වැඩසටහන යටතේ ඇමරිකා එක්සත් ජනපදයේ ජේම්ස් පපාපිඩ් මහතාගේ ප්‍රධානත්වයෙන් යුතු නියෝජිතයින් පස් දෙනෙකුගෙන් යුත් පිරිසක් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ සංචාරයක නිරත වූහ. මෙම දූත පිරිස 2012.12.03 දින නැගෙනහිර පළාත් ගරු ප්‍රධාන අමාත්‍යතුමා හා පළාත් අමාත්‍ය හාෆිස් නසීර් අහමඩ් මැතිතුමා වෙන වෙනම හමුවූහ. මෙම අවස්ථාවේදි නැගෙනහිර සංවර්ධනය පිළිබඳව ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඔවුන් සමග සාකච්ඡා කළේය.එසේම නැගෙනහිර පළාතේ තිබෙන දුගීබව හා විරැකියාව වැනි සමාජ ප්‍රශ්ණ වලට විසඳුම් සෙවීම සඳහා විදේශ මූලය ආයෝජනය තුළින් රැකියා අවස්ථා ඇති කර ගැනීමේ අවශ්‍යතාවයන් පිළිබඳව සාකච්ඡා කරන ලදි.

වර්ල්ඩ් ලෙනින් සංවිධානයේ අනුග්‍රහය යටතේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයට පැමිණි මෙම දූත කණ්ඩායම ඇමතිවරු හමුවීමේදි ජනතා පෙරමුණේ මහ ලේකම් පාර්ලිමේන්තු මන්ත්‍රී ජේ. ශ්‍රී රංගා මහතා ද සහභාගි විය.